රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - **2020**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 06(2)(අ) වගන්තිය | සේවකයා සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප හෝ වේතනය මත පදනම්ව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවට සේවකයාගේ සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගෙන සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකු වෙත පාරිතෝෂික දීමනා ලෙස රු.මිලියන 2.46 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | පාරිතෝෂික දීමනාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ගෙවන බව හා ඉදිරියේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා ගැනීමට කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව සේවක පාරිතෝෂික වෙන් කිරීමට හා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 103, 104 හා 105 | 2020 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි පිරිවැය රු.5,959,483 ක්වූ අමුද්‍රව්‍ය තොග, පිරිවැය රු.6,030,600 ක්වූ නොනිමි ද්‍රව්‍ය තොග, පිරිවැය රු.3,383 ක්වූ නිමි ද්‍රව්‍ය තොග හා මුළු පිරිවැය රු.59,259,389 ක්වූ ස්ථාවර වත්කම් ඒකක 346 ක් විධිමත් ලෙස අපහරණය කිරීමටද, භාවිතයට ගත නොහැකි තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට හා අදාළ පරිදි අලාභය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලය විසින් අදාළ සියළු අයිතම හඳුනාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඉතා ඉක්මනින් අපහරණය කිරීමට කටයුතු කරමින් සිටින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වත්කම් විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කළ යුතු අතර භාවිතයට ගත නොහැකි තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට හා අදාළ පරිදි අලාභය අයකර ගැනීමටද කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 ජුලි 23 දිනැති අංක PED/A /Surplus/1/11(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය | සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාරය වෙත පවරා ගෙන තිබුණු භාණ්ඩාගාර අරමුදල් ආයෝජන රු.24,632,603 ක් භාණ්ඩාගාර බදු වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් | සංශෝධිත ගිණුම් මඟින් නිවැරදි කර ඇති අතර එය විශේෂ බදු වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. | භාණ්ඩාගාර දායකත්වය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර දායකත්වය වෙනුවෙන් වෙනත් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. | | |
| (ඈ) | 2020 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී 03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එක් සේවකයෙකු වෙත වාර්ෂිකව රු.13,500 ක් පමණක් ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකි වුවද, සංස්ථාව විසින් ඊට අමතරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එක් සේවකයෙකුගේ මසක වැටුප විශේෂ ප්‍රසාද දීමනාවක් ලෙසද, එක් සේවකයෙකුට රු.5,000 ක් හෝ රු.10,000 ක් බැගින් සභාපති ප්‍රසාද දීමනාවක් ලෙසද ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛයෙන් අනුමත සීමාව ඉක්මවා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසාද දීමනා ලෙස රු.16,577,284 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2020 වර්ෂයේ මුළු ලංකාවටම බලපෑ කොවිඩ් වසංගතය මධ්‍යයේ, රජයේ රෝහල්වලට අත්‍යාවශ්‍ය ඖෂධ අවශ්‍යතාවය සපුරාලීමට සියළු සේවකයන් නොකඩවා සේවය කළ බව, එම සේවය ඇගයීම සඳහාත්, තවදුරටත් ඔවුන් දිරිමත් කිරීම උදෙසාත්, ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අදාළ විශේෂ ප්‍රසාද දීමනාව හා සභාපති ප්‍රසාද දීමනාව ගෙවන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඊට පටහැනිව කටයුතු කිරීම සඳහා චක්‍රලේඛය නිකුත් කළ දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඉ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය | වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 03 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. | මෙම තනතුරේ සේවය කළ නිලධාරිනිය සේවයෙන් අස්වීම හේතුවෙන් එම අංශයේම කළමනාකරු ලෙස සේවය කළ නිලධාරියෙකු වැඩ බැලීම සඳහා පත් කළ බව, ඔහුගේ උපරිමයෙන් එම තනතුරේ කටයුතු කරමින් සිටින බව, කිහිප අවස්ථාවකදීම එම තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවූ නමුත් සුදුසුකම් සැපිරූ කිසිදු අයදුම්කරුවෙක් අයදුම්කර නොතිබුණු බව, නැවතත් අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරමින් පවතින බව, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නැවතත් කරුණු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කර ඇති බව හා ඒ සම්බන්ධව | -එම- |

| | | | |
|---|---|---|---|
| | | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව. | |
| (ඊ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 101 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා ආපදා ණය ලෙස මුළු මුදල රු.12,429,500 ක් ගෙවා තිබුණි. | මෙම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය විශේෂයෙන්ම අදාළ වන්නේ රජයේ දෙපාර්තමේන්තු වැනි රාජ්‍ය ආයතන සඳහා වන බව හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වැනි සංස්ථා මණ්ඩල සඳහා කළමණාකරන සේවා චක්‍රලේඛ අදාළ වන බව | සංස්ථාවට ආවේනික වූ ආයතන සංග්‍රහයක් පිළියෙල කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා තෙක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ කර ගත යුතුය. |
| (උ) 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇමතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | | | |
| (i) 02-01ඡේදය | සංස්ථාවේ විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය සලකා ප්‍රවාහන දීමනා ගෙවිය යුතු වුවද, දුර ප්‍රමාණය නොසලකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2019 වර්ෂයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව එම මාසික දීමනාව පිළිවෙලින් රු.8,000 ක් හා රු.6,000 ක් දක්වා වැඩිකර ගෙවා තිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නැවතත් ලිපියක් යවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. මේ වන විට ගෙවා ඇති දීමනා සම්බන්ධයෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 02- 02ඡේදය | කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවද, ඊට අනුකූල නොවන ලෙස 2011 ජූලි 01 දින සිට මාසිකව උපරිමය රු.12,000 කට | 2009 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන විට නිෂ්පාදන දිරි දීමනාව රු.4,000 ක් වූ බව, නමුත් උද්ධමනය සැලකිල්ලට ගෙන 2019 වර්ෂයේදී | -එම- |

| | | | |
|---|---|---|---|
| | යටත්ව සමස්ථ කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණු රු.18,999,486 ක්ද ඇතුළුව 2011 ජුලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී නිෂ්පාදන දිරි දීමනා ලෙස වැඩියෙන් ගෙවා තිබුණු මුළු මුදල රු.121,234,241 ක් විය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකට අනුව නිෂ්පාදන දිරිදීමනාව රු.12,000 ක් ලෙස වැඩි කරන ලද බව හා මෙම කරුණ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නැවතත් ලිපියක් යවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනබව. | |
| (iii) 02-03 ඡේදය | (i) පැමිණීමේ දිරි දීමනා ලෙස මසකට එක් සේවකයෙකුට රු.2,000 ක් පමණක් ගෙවීමට අනුමැතිය ලැබී තිබුණද එය රු.3,500 ක් දක්වා වැඩි කර ගෙවා තිබුණි. | උද්ධමනය සැලකිල්ලට ගෙන 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකට අනුව පැමිණීමේ දිරිදීමනාව රු.3,500 ක් ලෙස වැඩි කරන ලද බව හා මෙම කරුණ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නැවතත් ලිපියක් යවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| | (ii) පැමිණීමේ දිරිදීමනා ගෙවන්නේ නම් වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු සඳහා මුදල් ගෙවිය නොහැකිවුවද, පැමිණීමේ දිරි දීමනාව ගෙවා තිබුණු සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු වෙනුවෙන් රු.12,475,703 ක් ගෙවා තිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නැවතත් ලිපියක් යවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| | (iii) අවුරුදු හා නත්තල් වෙනුවෙන් වර්ෂයකට එක් අයෙකුට එක් වතාවක් පමණක් රු.6,000 ක තෑගි වවුචර් ලබාදිය හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ස්ථිර සේවකයන්ට රු.25,000 ක් බැගින් හා පුහුණු සේවකයන්ට | උද්ධමනය සැලකිල්ලට ගෙන 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකට අනුව අවුරුදු දීමනාව රු.25,000 ක් ලෙසද නත්තල් දීමනාව රු.12,500 ක් ලෙසද වැඩි කළබව හා මෙම කරුණ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත | - එම - |

| | | | |
|---|---|---|---|
| | රු.12,500 ක් බැගින් වූ මුළු වටිනාකම රු.7,325,000 ක් වූ තෑගි වවුචර්ද, ඊට අමතරව පාසල් පොත් හා උපකරණ මිලදී ගැනීමට ස්ථිර සේවකයෙකුට රු.12,500 ක් බැගින් හා අනෙකුත් සේවකයන්ට රු.6,250 ක් බැගින් මුළු වටිනාකම රු.4,712,500 ක් වූ තෑගි වවුචර්ද පිරිනමා තිබුණි. | නැවතත් ලිපියක් යවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | |
| (iv) 02-06 ඡේදය | යම් සේවකයෙකු නියමිත සේවා මුර සියල්ලටම පැමිණියහොත් පමණක් රු.1,000 ක මාසික දීමනාවක් ගෙවිය හැකි වුවද, සහභාගී වූ එක් එක් සේවා මුරයක් වෙනුවෙන් විධායක, පුහුණු වන විධායක හා විධායක නොවන සේවකයන්ට පිළිවෙලින් රු.400 ක්, රු.300 ක් හා රු.200 ක් බැගින් වන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රු.6,981,100 ක් සේවාමුර දීමනාව වශයෙන් ගෙවා තිබුණු අතර වැඩිපුර ගෙවා තිබුණු සේවාමුර දීමනාව රු.3,549,100 ක් විය. | දැනට මෙම සියළු දීමනා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවන බව හා මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිඛිත අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | - එම - |
| (ඉ) 2015 ජුනි 04 දිනැති අංක BP/30/15 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය | සංස්ථාවේ සේවකයන් සඳහා ගෙවනු ලබන පා පැදි ණය 2015 ජුනි 04 දින සිට රු.3,000 සිට රු.20,000 දක්වා වැඩිකර තිබුණු නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | - එම - | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,017,364,317 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.434,777,878 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.582,586,439 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම සියයට 35 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රු.99,189,983 ක් හා රු.49,137,643 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 50 කින් අඩුවී තිබුණි. එහි ඇතුළත් විකුණුම් ප්‍රවර්ධන වියදම සියයට 86 කින් අඩුවීම ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 1.9 කින් සහ සියයට 4.7 කින්ද, ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 3.6 කින්ද වැඩිවී තිබුණු අතර ණය අයකර ගැනීමේ කාලය දින 64 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිලදී ගෙන තිබුණු ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 3,105.25 ක් හා ඇසුරුම් ද්‍රව්‍ය තොග ඒකක 292,938 ක් විවිධ හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් රු.3,429,299 ක අලාභයක් සිදුවී තිබුණි. | කල් ඉකුත්වීම, යන්ත්‍ර මගින් ප්‍රතික්ෂේප වීම, ඇසුරුම් හානිවීම නිසා ප්‍රතික්ෂේප වීම හා නව නිෂ්පාදන හඳුන්වාදීම හේතුවෙන් තොග භාවිතයෙන් ඉවත්කිරීම ආදී හේතූන් නිසා මෙම තොග ප්‍රතික්ෂේපවීම සිදුවී ඇති බව. | අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම් හා කල් ඉකුත්වීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභයට වගකිව යුතු පාර්ශ්වයන් වෙතොත් ඔවුන් හඳුනා ගැනීමට හා අදාළ පරිදි අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර තොග විධිමත් පරිදි අපහරණය කර පොත්වලින් ඉවත් කිරීමටද කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණින් මුළු මුදල රු.133,767,599 ක් වැයකර මිලදී ගෙන නවීකරණය කර තිබුණු ගොඩනැගිල්ලක් 2019 අගෝස්තු 20 දින සිට 2021 ඔක්තෝබර් 31 දින වන විටත් නිශ්කාර්යව වසා දමා තිබුණු අතර රසායනාගාරය සහ පුහුණු පාසලක් පිහිටුවීම | කළුතර, වැලිපැන්න හා බුලත්සිංහල ප්‍රදේශ ආශ්‍රිතව ඖෂධ නිෂ්පාදන කර්මාන්ත කලාපයක් (Proposed Pharma zone) ඇති කිරීමට 2017 වර්ෂයේ තීරණය කරනු ලැබීමත් සමඟ මෙම දේපල මිලටගත් බව, සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කරන කර්මාන්ත ශාලාවල සේවකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් සහ නිෂ්පාදනය කරන ඖෂධවල ප්‍රමිතිය පවත්වාගෙන යාමට පොදු පරීක්ෂණ රසායනාගාරයක් මෙහි ස්ථාපිත | ගොඩනැගිල්ල උපයෝජනය සඳහා නිශ්චිත සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා සපුරාලිය යුතු අනෙකුත් අවශ්‍යතා කිසිවක් සඳහා සංස්ථාවේ පෙර සැලසුමක් හෝ සූදානමක් නොතිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබුණි. | කිරීමට අපේක්ෂා කළ බව හා මෙම කටයුතු සිදු කර ගැනීමට නොහැකි වීම නිසා මෙම දේපල විකුණා දැමීම සම්බධව තීරණයක් ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කළ බව. | |
| (ආ) | 2017 අගෝස්තු 06 දින ඉදිකිරීම් ආරම්භ කර රු.89,898,864 ක් වැයකරමින් Cephalexin නිෂ්පාදනාගාරය නවීකරණය කර 2019 අගෝස්තු 09 දින වන විට වැඩ අවසන් කර තිබුණි. නමුත් Cephalexin ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට හෝ අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. ඉන් පසුව එහි Levothyroxine tablets IP 50mg නිෂ්පාදනය ආරම්භ කිරීමට සැලසුම් කර 2020 දෙසැම්බර් 23 දින නිෂ්පාදනාගාර පරිශ්‍රය විවෘත කිරීමේ සමාරම්භක උළෙල පැවැත්වීම සඳහා රු.3,798,296 ක් වැයකර තිබුණි. නමුත් 2021 ඔක්තෝබර් 31 දින වන විටත් මෙම නිෂ්පාදනාගාරය තුළ වානිජමය වශයෙන් කිසිදු ඖෂධයක් නිෂ්පාදනය කර නොතිබුණි. | රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙන්ම Cephalexin capsules ඖෂධය සඳහා පැවති අධික ඉල්ලුම නිසා Cephalosporin නිෂ්පාදනාගාරය ආරම්භ කළ බව, නමුත් නිෂ්පාදනාගාරයේ වැඩ නිමකරන විට මෙම ඖෂධය සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැතිවූ බව, ඒ අනුව Cephalexin capsules ඖෂධය වෙනුවට Levothyroxine tablets සහ Flucloxacillin capsules නිෂ්පාදනය කිරීමට පසුව තීරණය කළ නමුත් එම ඖෂධ නිෂ්පාදනය සඳහා ඖෂධ නියාමන අධිකාරිය මගින් තවමත් අවසරදී නොමැති බව හා මූලික අධීක්ෂණයකින් පසුව වෙනස් කිරීම් කීපයක් යෝජනා කර තිබුණු අතර එම කටයුතු නිමවා මේ වන විට දෙවන අධීක්ෂණයකට සූදානම්ව ඇති බව. | ආයෝජනයන්ගෙන් උපරිම උපයෝජන ගත හැකි වන ලෙස ඊට අදාළ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා සැලසුම් කළ යුතුය. |
| (ඇ) | මුළු පිරිවැය රු.328,849,588 ක් වූ ජංගම නොවන වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. | අප ආයතනය මගින් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සියළු කටයුතු සිදු කිරීමට ස්ථාවර වත්කම් කමිටුවක් පත් කර ඇති බව, එම කමිටුව මගින් ස්ථාවර වත්කම්වල තත්ත්වය, ඒවායේ ආයු කාලය හා ඵලදායී නොවන වත්කම් යනාදිය හඳුනා ගනු ලබන අතර එසේ ඵලදායී නොවන වත්කම් ඉවත් කිරීමට කටයුතු කරන බව, එමෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ස්ථාවර වත්කම් ඇස්තමේන්තුගත කිරීම සඳහා 2020 වර්ෂයේ සිට කටයුතු කරමින් සිටින බව, එහෙත් රට තුළ දිගින් දිගටම පවතින වසංගත තත්ත්වය හමුවේ මෙම කාර්යය කිරීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇතිබව හා 2021 වර්ෂයේදී මෙම කාර්යය අනිවාර්යයෙන්ම සිදුකරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය 16 හි 51 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්ථාවේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික නිෂ්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර ඒ වෙනුවට මාසික නිෂ්පාදන සැලැසුම් පිළියෙල කර තිබුණි. | වාර්ෂික නිෂ්පාදන සැලැස්මක් 2022 වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු කරන බව. | වාර්ෂික නිෂ්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ii) අලෙවි සැලැස්මට අනුව හා මාසික නිෂ්පාදන සැලසුම්වලට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය අතර ඖෂධ වර්ග 47 ක ඒකක මිලියන 350 ක වෙනසක් පැවතුණි. | මෙහි සඳහන් ඇතැම් නිෂ්පාදනයන්වල වෙළඳපල ඉල්ලුම පැවතියද 2020 වර්ෂයේදී නිෂ්පාදන කටයුතු සිදු නොකළ බව හා සත්‍ය වශයෙන් ලද ඇණවුම ඇස්තමේන්තුගත ගත ප්‍රමාණයට වඩා අඩු/වැඩි වීම, නිෂ්පාදන යන්ත්‍රවල පවත්නා උපරිම ධාරිතාව, මාසික ඉල්ලුම් මත පදනම්ව පිළියෙල කරන නිෂ්පාදන අවශ්‍යතාවය එනම් අලෙවි සැලැස්මේ සියලුම නිෂ්පාදනයන් අදාළ කාලසීමාව තුළ නිෂ්පාදනය කිරීමට තරම් නිෂ්පාදනාගාර පහසුකම් නොමැතිවීම, අමුද්‍රව්‍යවල ඇතිවන ඌනතාවයන් හා ඇතැම් නිෂ්පාදනයන් නිෂ්පාදන කටයුතු කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටලු ආදී කරුණු හේතුවෙන් සමහර අයිතමයන් සැලසුම් කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් හා අඩුවෙන් නිෂ්පාදනය කළ බව. | තාත්වික වාර්ෂික අලෙවි සැලැස්මක් මෙන්ම තාත්වික වාර්ෂික නිෂ්පාදන සැලැස්මක්ද පිළියෙල කළ යුතු අතර ඒවායේ සඳහන් ඉලක්ක කරා ළඟාවීමට උපරිම උත්සාහය දැරිය යුතුය. |
| (iii) අලෙවි සැලැස්මට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය ඖෂධ වර්ග 28 ක ඒකක මිලියන 2,077 ක්වූ නමුත් සත්‍ය නිෂ්පාදනය ඖෂධ වර්ග 24 ක ඒකක මිලියන 1,535 ක් පමණක් විය. | සත්‍ය වශයෙන් ලද ඇනවුම ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩු/වැඩි වීම, නිෂ්පාදන යන්ත්‍ර වල පවත්නා උපරිම ධාරිතාව, මාසික ඉල්ලුම් මත පදනම්ව පිළියෙල කරන නිෂ්පාදන අවශ්‍යතාවය එනම් අලෙවි සැලැස්මේ එන සියලුම නිෂ්පාදනයන් අදාළ කාලසීමාව තුළ නිෂ්පාදනය කිරීමට තරම් නිෂ්පාදනාගාර පහසුකම් නොමැතිවීම, අමුද්‍රව්‍යවල | උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් සහ ඵලදායීතාවයෙන් නිෂ්පාදනය කිරීම සඳහා තාත්වික නිෂ්පාදන සහ අලෙවි සැලසුම් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඇතිවන ඌනතාවයන් හා ඇතැම් නිෂ්පාදනයන් නිෂ්පාදන කටයුතු කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටලු ආදී වූ කරුණු හේතුවෙන් ඇතැම් අයිතමයන්හි නිෂ්පාදනය සැලසුම් කළ ප්‍රමාණයට වඩා අඩු බව. | |
| **(iv)** අලෙවි සැලැස්මට අනුව ඖෂධ වර්ග 17 ක මුළු නිෂ්පාදන අවශ්‍යතාවය ඒකක මිලියන 163 කින් ඉක්මවමින් ඒකක මිලියන 1,206 ක් නිෂ්පාදනය කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී ඉන් ඒකක මිලියන 999 ක් පමණක් අලෙවි කර තිබුණු අතර ඉතිරිවී තිබුණු ඒකක මිලියන 207 න් ඖෂධ අයිතම 3 ක ඒකක මිලියන 3.07 ක් සඳහා 2021 වර්ෂය වෙනුවෙන්ද වෛද්‍ය සැපයුම් අංශය වෙතින් ඇනවුම් ලැබී නොතිබීම නිසා අලෙවි කර ගැනීමට නොහැකිවී තිබුණි. | ඇස්තමේන්තුගත ඒකක ප්‍රමාණයට වඩා සත්‍ය නිෂ්පාදන ඒකක ප්‍රමාණය වැඩිවීමක් පැවති නමුත් එම නිෂ්පාදනයන්ගෙන් නිෂ්පාදන අයිතම 3 ක අතිරික්තව ඇති තොගය හැරෙන්නට අනෙකුත් නිෂ්පාදනයන් 2021 වර්ෂය සඳහා වන ඇණවුම පාදක කරගෙන සැපයිය හැකි බව, නමුත් අයිතම 3 ක් සඳහා 2021 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙතින් ඇනවුම් නොලැබීම හේතුවෙන් එම තොග අලෙවි කර ගැනීම ගැටළුකාරී වී ඇති බව. | උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් සහ ඵලදායීතාවයෙන් නිෂ්පාදනය කිරීම සඳහා තාත්වික නිෂ්පාදන සහ අලෙවි සැලසුම් පිළියෙල කළ යුතු අතර එම සැලසුම් කාලීන අවශ්‍යතා හා වෙනස්වීම්වලට අනුව අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම සඳහා උපරිමයෙන් කටයුතු කළ යුතුය. |
| **(v)** සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ගවල පෙති කුඩා කොටස්වලට කැඩී යාමේ හැකියාව ඉහළ යාම, ඖෂධ පෙතිවල බරෙහි ඇතිවූ විචලතා, අයහපත් පෙනුම හා ඖෂධ පෙති කැඩීමට ඇති වූ අපහසුතා වැනි හේතූන් මත නිෂ්පාදනය අතරමඟ නවතා නැවත නිෂ්පාදනය කිරීමට සිදුවීම හේතුවෙන් වැයවී තිබුණු අතිරේක පිරිවැය රු.2,563,069 ක් විය. සෑම වර්ෂයකදීම නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුවන මෙම අයහපත් තත්ත්වයන් අවම කරගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙති කුඩා කොටස්වලට කැඩීයාමේ හැකියාව ඉහළ යාම හා ඖෂධ පෙතිවල බරෙහි ඇතිවන විචලතා යනාදිය ඖෂධ නිෂ්පාදනයේදී මතු වන ප්‍රායෝගික ගැටළු බව, එම ඖෂධ නැවත නිෂ්පාදනය කිරීමේදී සක්‍රීය අමුද්‍රව්‍ය නැවත එකතු කිරීමක් නොකරන බව, ඒ වෙනුවට සහායක අමුද්‍රව්‍ය පමණක් එකතුකරන බව, සහායක අමුද්‍රව්‍යවල පිරිවැය, නැවත නිෂ්පාදනයේදී වැය වන අමතර ශ්‍රම පිරිවැය හා පොදු කාර්යය පිරිවැය යන පිරිවැය පමණක් නැවත මුළු නිෂ්පාදන පිරිවැයට එකතුව වන බව. | ඖෂධවල ගුණාත්මක තත්ත්වය ඉහළ නංවා ගැනීමට හා නිෂ්පාදන ගැටළු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (vi) ඉකුත් වර්ෂ දෙකකදී හා සමාලෝචිත වර්ෂය තුළදී පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගෙන තිබුණු මුළු පිරිවැය රු.2,042,844 ක් වූ ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 213 ක් 2021 පෙබරවාරි 17 දින වන විටත් භාවිතයකින් තොරව පැවතුණි. ඉන් ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 175 ක් නියමිත ප්‍රමිතියෙන් නොතිබුණු බවද තහවුරු විය. | පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගන්නා අමුද්‍රව්‍ය නව නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම අනුව භාවිතයට ගන්නා බව හා ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 175 ක් ප්‍රතිස්ථාපනය කිරීමට සැපයුම්කරු එකඟවී ඇති බව. | අලෙවි සැලැස්ම හා නිෂ්පාදන සැලැස්ම මත පදනම්ව අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ සැලැස්ම පිළියෙල කර අමුද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කළ යුතු අතර නව ඖෂධ සඳහා වන පර්යේෂණ කඩිනම් කළ යුතුය. |
| (vii) ඉකුත් වර්ෂයේදී හඳුන්වාදී තිබුණු Clarithromycin Tablets USP 500mg යන ඖෂධයද, සමාලෝචිත වර්ෂයේදී හඳුන්වාදී තිබුණු Clopidogrel 75mg tablets, Nimodipine tablets 30mg, Tramadol Capsule 50mg, Flucloxacillin capsules 500mg හා Prednisolone tablets 1mg යන ඖෂධවලද නිෂ්පාදනය ආරම්භ කර නොතිබුණු අතර නිෂ්පාදන සැලැස්මටද ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව වාර්ෂිකව හඳුන්වා දෙන නව නිෂ්පාදන අඛණ්ඩව නිෂ්පාදනය කිරීමට සහ ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බවත් ඒ හේතුවෙන් නිෂ්පාදන මිශ්‍රණයට නව හඳුන්වාදීම්වලින් ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොමැති බවත් නිරීක්ෂණය විය. | Clarithromycin Tablets USP 500mg ඖෂධය සඳහා 2020 වර්ෂයට වෛද්‍ය සැපයුම් අංශයෙන් ඇණවුමක් ලැබී ඇති බව, අනෙකුත් අයිතමයන් 2020 වර්ෂයේ අග භාගයේදී හඳුන්වාදුන් බැවින් වෛද්‍ය සැපයුම් අංශයෙන් 2021 වර්ෂය සඳහා ඇණවුම් ලැබී ඇති බැවින් 2021 වර්ෂයේදී මෙම අයිතමයන්ගේ නිෂ්පාදන කටයුතු මෙන්ම ප්‍රවර්ධන කටයුතුද සිදු කිරීමට හැකි වනු ඇති බව. | වාර්ෂිකව හඳුන්වාදෙන නව නිෂ්පාදන අඛණ්ඩව නිෂ්පාදනය කිරීමට සහ ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. |
| (ආ) සංස්ථාවේ ඖෂධ අලෙවිය හා බෙදාහැරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) අමුද්‍රව්‍ය නොමැති වීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන ක්‍රියාවලියේ පවත්නා තාක්ෂණික දෝෂ ආදී විවිධ හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධ වලින් විකුණුම් වටිනාකම රු.මිලියන 1,003 ක්වූ ඖෂධ වර්ග 26 කින් ඒකක මිලියන 570.78 ක ප්‍රමාණයක් සැපයීමට සංස්ථාව | Theophylline ER Tab 125mg ඇතුළු ඖෂධ වර්ග කීපයක් වෛද්‍ය සැපයුම් අංශය විසින් පමා කරන ලෙස ඉල්ලීම් කළ බව හා රටේ පැවති වාතාවරණය හමුවේ සමහර ඖෂධවල අවශ්‍යතාවය අපේක්ෂිත මට්ටමේ නොපැවති බව. | වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය ගනිමින් තම වෙළඳපල කොටස ආරක්ෂා කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අපොහොසත්වී තිබුණු අතර ඉන් විකුණුම් වටිනාකම රු.මිලියන 44.10 ක් වූ Theophy.ER Tab 125mg ඖෂධයෙන් ඒකක මිලියන 30 ක සම්පූර්ණ අවශ්‍යතාවයම සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | | |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළදී විකුණුම් වටිනාකම රු.මිලියන 616 ක්වූ ඖෂධ වර්ග 28 ක ඒකක මිලියන 549 ක දේශීය වෙළඳපල අලෙවි ඉලක්කයන් සපුරාගත නොහැකිවී තිබුණු අතර ඉන් විකුණුම් වටිනාකම රු.මිලියන 3.92 ක් වූ ඒකක මිලියන 5.21 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු ඖෂධ අයිතම 02 කින් කිසිදු ප්‍රමාණයක් අලෙවි කිරීමට නොහැකිවී තිබුණි. | 2020 වර්ෂය පුරාවට ඇතැම් නිෂ්පාදනවල නිෂ්පාදන කටයුතු සිදු නොවීම, රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ ඇතැම් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩුවීම, වෛද්‍ය සැපයීම් අංශයෙන් ඇස්තමේන්තුගත ඇනවුම් ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් සඳහා ඇණවුම් ලැබීම, නිසි වේලාවට අමුද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වීම, පවත්නා කොවිඩ් 19 හමුවේ ලෝක වෙළඳපල තුළ අමුද්‍රව්‍ය සැපයීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් ඇතිවීම හා අමුද්‍රව්‍ය මිල අසාමාන්‍ය ලෙස ඉහල යාම හා නිෂ්පාදන ක්‍රියාවලියේ පවත්නා තාක්ෂණික දෝෂ යනාදිය හේතුවෙන් අලෙවි ඉලක්ක සපුරාගත නොහැකි වූ බව. | වාර්ෂික අලෙවි සැලැස්මේ ඉලක්ක කරා ළඟා වීමට උපරිම උත්සාහය දැරිය යුතුය. |
| (iii) | අලෙවි සැලැස්මට ඇතුළත් නොකළ විකුණුම් වටිනාකම රු.මිලියන 854 ක්වූ ඒකක මිලියන 115 කින් සමන්විත ඖෂධ හා වෙනත් අයිතම 30 ක් සමාලෝචිත වර්ෂයේදී අලෙවි කර තිබුණි. | මෙම නිෂ්පාදන අලෙවි සැලැස්ම තුළ අන්තර්ගත වී නොමැති නමුත් දේශීය ඖෂධ නිෂ්පාදන කර්මාන්තය වැඩි දියුණු කිරීම වර්තමාන රජයේ ප්‍රතිපත්තියක් වන බැවින් ආනයනය කිරීම් හරහා මිලදී ගත් බොහෝමයක් ඖෂධ නිෂ්පාදනයන් දේශීයව නිෂ්පාදනය කිරීමට පටන් ගත් බව. | තාත්වික වාර්ෂික අලෙවි සැලසුම් පිළියෙල කර අවශ්‍යතාවය පරිදි සංශෝධනය කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ඇසුරුම් ද්‍රව්‍ය තොග තුළ ඇතුළත් පිරිවැය රු.314,716 ක් වූ 60ml ප්ලාස්ටික් බෝතල් 20,200 ක් 2013 දෙසැම්බර් සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම බෝතල්වල ඇසුරුම් කිරීමට අපේක්ෂිතව තිබුණු නිෂ්පාදන තවදුරටත් එම බෝතල්වල ඇසුරුම් නොකිරීම හේතු කොට ගෙන භාවිතයට ගෙන නොමැති බව හා දැනට දිරාපත්වී ඇති බැවින් විධිමත් පරිදි අපහරණය කිරීමට නියමිත බව. | විධිමත් පරිදි අපහරණය කළ යුතුය. |
| (ඈ) | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාල සීමාව තුළදී භාණ්ඩ නිෂ්කාශන සමාගම් 23 ක තැන්පත් කර තිබුණු රු.736,000 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇතැම් තැන්පතු දැනටමත් ආපසු ලබා ගෙන ඇති බව, ආපසු ලබා ගත නොහැකි තැන්පතු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව, කොරෝනා වසංගතය හේතුවෙන් බොහෝ නිෂ්කාශන සමාගම් වසා | නිශ්කාශනයන් නිමවූ වහාම තැන්පතු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තබමින් අත්‍යාවශ්‍ය කටයුතු වලට පමණක් සීමා වූ බැවින් හා මාර්ගගත ක්‍රමයට වැඩ කිරීම හේතුවෙන් තැන්පතු ආපසු ලබා ගැනීම දුෂ්කර වූ බව. | |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීමේදී ක්‍රියාත්මක කර තිබුණු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු අනුමැතියට පෙර සහ ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම සැපයුම්කරු වෙත ඇණවුම් නිකුත් කර තිබුණි. | ඇතැම් අයිතමවල තොග මට්ටම අනුව ඉක්මනින් ලබා ගැනීමේ අවශ්‍යතාවය මත තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට ගත වන කාලය සලකා බලා එම කමිටුවල ආවරණ අනුමැතියට යටත්ව සැපයුම්කරු වෙත ඇනවුම් නිකුත් කර ඇති බව හා තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු ආවරණ අනුමැතිය පසුව ලබා ගෙන ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ කමිටු පත්කර නොතිබුණු අතර 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි. | අවශ්‍යතාවය මත පවතින අනුමැතීන් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. | සැපයුම්කරුවන් කාර්යසාධන සුරක්ෂණය ලබාදී නොතිබුණු අවස්ථාවලදී ඒ වෙනුවට ගෙවිය යුතු මුදලින් සියයට 10 ක් රඳවා ගැනීමට කටයුතු කරන බව හා දේශීය සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී දින 30 සිට දින 60 දක්වා සම්පූර්ණ මුදල සඳහා ණය කාල සීමාවක් සංස්ථාව විසින් ලබා ගන්නා බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය | කොරෝනා වසංගතය හේතුවෙන් බොහෝමයක් සැපයුම් ආයතන | -එම- |

| | | |
|---|---|---|
| ප්‍රකාරව, රු.500,000 ඉක්මවූ භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය සැපයුම්කරු වෙතින් ලබා ගෙන නොතිබුණි. | වසා තිබියදී හා සංස්ථාව ඉතා අවම සේවක සංඛ්‍යාවක් සහිතව පවත්වා ගෙන ගිය අවස්ථාකදී කොන්ත්‍රාත් ගිවිසුම් හා පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය (PCA4 ආකෘතිය) මත රැඳී නොසිට අවසාන අරමුණ වන තොග පවත්වා ගැනීම සඳහා කටයුතු කර ඇති බව හා මෙහිදී සිදු විය හැකි අවදානම අවම කිරීම සඳහා සැපයුම්කරු සම්බන්ධව නිරන්තර විමසිල්ලෙන් කටයුතු කළ බව. | |

## 3.5 බද්ධ ව්‍යාපාර කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහාවූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හි දී ගිවිසුම් ගතවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම බද්ධ ව්‍යාපාර සමඟ සංස්ථාව ගනුදෙනු සිදුකර තිබුණු ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) ආයෝජකයින් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගතවී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විට ආයෝජකයින් තිදෙනෙකුගෙන් පමණක් ඖෂධ මිලදී ගෙන තිබුණි. | වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමට අවශ්‍ය නිෂ්පාදනාගාර පහසුකම් සහ සුදුසුකම් සපුරා තිබුණේ ආයෝජකයන් දෙදෙනෙකු විසින් පමණක් බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතු අතර ගිවිසුම් ගතවූ අනෙකුත් ආයෝජකයන්ගේ තත්ත්වයන් පිළිබඳ නිරන්තරව පසු විපරම් කරමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බද්ධ ව්‍යාපාර පිහිටුවීම පිණිස වූ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටු නිර්දේශය ප්‍රකාරව, සංස්ථාව විසින් ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගත විය යුත්තේ එම ඖෂධ නිෂ්පාදකයා (Producer) සමඟ විය යුතු වුවද, නිෂ්පාදකයෙක් නොවූ අතරමැදි සැපයුම්කරුවෙකු පමණක් වූ ආයෝජකයෙක් සමඟ ගිවිසුම් ගතවී සැපයුම් භාරගෙන තිබුණි. | මෙම ආයතනය සමඟ අත්සන් කළ ත්‍රෛපාර්ශවීය ගිවිසුම 2020 මැයි 30 දින කල්ඉකුත්වීම මත අවලංගුවී ඇති බව, මින් ඉදිරියේදී Glosante Pvt. Ltd. ආයතනය සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම් ගත වන්නේ නම් ඔවුන් විසින් සැපයිය යුත්තේ ඔවුන්ගේ නිෂ්පාදනාගාරය හරහා නිපදවන ඖෂධ පමණක් බව, මෙහිදී නිෂ්පාදනාගාරය සඳහා ලබාගත් GMP සහතිකය, නිෂ්පාදන බලපත්‍රය සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචි සහතිකය එම ආයතනය නමින් ලබාගත් සහතික වියයුතු බව හා ඔවුන් දැනටමත් ලියාපදිංචිය සඳහා NMRA වෙත ලියවිලි ඉදිරිපත් කළ බව දන්වා එවා ඇති බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | බද්ධ ව්‍යාපාර ගිවිසුම අනුව ආයෝජකයා විසින් නිෂ්පාදනය කරන ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු විය. සමාලෝචිත වර්ෂය තුළදී එවැනි එක් ආයෝජකයෙකුගෙන් සපයාගෙන වෛද්‍ය සැපයුම් අංශයට අලෙවිකර තිබුණු ඖෂධ අයිතම 06 ක මුළු නිෂ්පාදන පිරිවැය රු.823,010,169 ක්වී තිබුණි. ඊට රු.129,898,488 ක ලාභ එකතුකර ඉන්වොයිස් වටිනාකම රු.952,908,657 කට සංස්ථාව වෙත සපයා තිබුණි. සංස්ථාව විසින් එම ඉන්වොයිස් වටිනාකමට තවත් රු. 66,692,327 ක සේවා ගාස්තු එකතු කර රු.1,019,600,983කට වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. එම ඖෂධ 06 හි මුළු පිරිවැයෙන් සියයට 16 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද ඉන්වොයිස් මිලෙන් සියයට 7 ක සේවා ගාස්තුවක් සංස්ථාව විසින්ද උපයා තිබුණි. ඒ අනුව මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 23 ක් ලාභ හා සේවා ගාස්තු වශයෙන් එකතුකර විකුණුම් මිල තීරණය කර තිබුණි. | රාජ්‍ය ආයතනයක් වශයෙන් අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී ටෙන්ඩර් ක්‍රමය අනුගමනය කළයුතු නමුත් පෞද්ගලික ආයෝජකයන්ට ඔවුන්ගේ ඒකක පිරිවැය අඩු වන ආකාරයට අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ හැකියාව ඇති බැවින් විකුණුම් මිල තීරණය කිරීමේදී සංස්ථාවේ සේවා ගාස්තු වැඩි අගයක් පෙන්නුම් කරන බව. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) බද්ධ ව්‍යාපාර වෙතින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ අයිතම 43 කින් ඖෂධ අයිතම 36 ක් සඳහා පමණක් සංස්ථාව විසින් තත්ත්ව පරීක්ෂාවන් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතමයන් 03 ක් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණද එම ද්‍රව්‍යයන්හි තත්ත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සංස්ථාව සතු නොවීම හේතුවෙන් සැපයුම්කරුවන් විසින්ම එක් එක් නිෂ්පාදන කාණ්ඩවල සාම්පල් කාර්මික තාක්ෂණික ආයතනය (ITI) වෙත යොමු කර තිබුණු අතර එම ආයතනයෙන් නිකුත් කරන පරීක්ෂණ වාර්තා අනුව පමණක් ඖෂධ වල තත්ත්වය තහවුරු කර තිබුණි. ඒ අනුව බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධ වල ගුණත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සිදුවී නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළදී ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතමයන් 03 ක් මිලදී ගෙන වෛද්‍ය සැපයුම් අංශයට සපයනු ලැබුවේ කාර්මික තාක්ෂණික ආයතනය (ITI) වෙත යොමු කොට තත්ත්ව පරීක්ෂාවක් කර එම ආයතනයෙන් නිකුත් කළ තත්ත්ව සහතිකය මත බව හා පවත්නා පද්ධතිය තුළ අදාළ ශල්‍ය උපකරණ පරීක්ෂා කිරීමේ පහසුකම් නොමැති බව. | බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සංස්ථාව විසින් සිදුකළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විනිවිදභාවයකින් තොරව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සමහර මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමෙන් තොරව ඉදිකිරීම් පිළිබඳ උපදේශකයින් හා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන තිබීම, කොන්ත්‍රාත් අවසන් කළ යුතු දිනයන් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ගිවිසුම් වලට ඇතුළත් කර නොතිබීම, නිසි අනුමැතියකින් තොරව නිරන්තරයෙන් මූලික සැලසුම් වෙනස් කිරීම, සැලසුම් හා ප්‍රමාණ පත්‍ර වලට අනුකූල නොවන ලෙස ඉදිකිරීම් සිදුකිරීම, ඉදිකිරීම් සිදු කිරීමේ අරමුණ වෙනස්වීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා | සංස්ථාවේ ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය ඇතුළු සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා සිවිල් ඉංජිනේරුවරයකු නොමැති බව, ආයතනය පවත්වා ගෙන යාමට අවශ්‍ය සියළු ඉංජිනේරුමය කාර්යයන් සිදුකරන අතරතුර උපදේශන සමාගම්වල සහායද ලබා ගෙන සංස්ථාවේ ඉංජිනේරු අංශය විසින් මේ සම්බන්ධ සියළුම රාජකාරි කරන බව, මේ කරුණු සලකා බලා ගොඩනැගිලි ඉදිකිරීම මෙන්ම එම ගොඩනැගිලි නඩත්තු කර පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත ආයතනයට නව සිවිල් ඉංජිනේරු තනතුරක් අනුමත කර ඇති බව හා ඉදිරියේදී එම තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කර මෙම අධීක්ෂණ සහ පරිපාලනමය අඩුපාඩු මඟ හරවා ගැනීමට කටයුතු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කොන්ත්‍රාත් පරිපාලන කටයුතු විධිමත්ව සිදුකළ යුතු අතර එම කාර්යයන් මනාව කළමණාකරනය කිරීමට මෙන්ම අධීක්ෂණය කිරීමටද කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යාම නිසා කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළදී වැඩ අවසන් කර ගැනීමට සංස්ථාව අපොහොසත්වීම මෙන්ම කොන්ත්‍රාත්තුව ඉටුකරන කාලය තුළදී සංස්ථාවේ වගකිව යුතු පාර්ශවයන්ගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොකිරීම ආදී වූ කරුණු හේතුවෙන් සිවිමහල් පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම, ගුවන් පාලම ඉදිකිරීම, වානේ ව්‍යුහ ගුදම ඉදිකිරීම, Penicillin Zone ගබඩාව Cephalosporin Production අංශය ලෙස පරිවර්තනය කිරීම හා බුලත්සිංහල ගොඩනැගිල්ල නවීකරණය කිරීම වැනි සංස්ථාවේ කොන්ත්‍රාත්වල පරිපාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | කරන බව. | |
| (ආ) | Penicillin Zone ගබඩාව Cephalosporin Production අංශය ලෙස පරිවර්තනය කරමින් G කලාපය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.80,510,608 ක් වූ නමුත් 2020 පෙබරවාරි 19 දින වන විට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා නොගෙන මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.11,918,835 කින් ඉක්මවා වැඩ ඉටුකරවා ගෙන තිබුණි. | මෙම නිෂ්පාදනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ සැලසුම් සහ ගොඩනැගීමේ පදනම මත (Design & Build basis) සංස්ථාවේ එවකට සේවය කළ ව්‍යාපෘති කළමණාකාරවරයාගේ අධීක්ෂණය යටතේ බව, නමුත් පසුව මෙම ඉදිකිරීම කරගෙන යන අතරතුර මෙවැනි ඖෂධ නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සුවිශේෂී කටයුත්තක් බවත් ශ්‍රී ලංකාවේ මෙවැනි ඉදිකිරීමක් සිදුකිරීමේදී උපදේශනය සහ අධීක්ෂණය සඳහා අත්දැකීම් ඉතා අවම බවත් පෙනී ගිය බව, මෙම ඉදිකිරීම් ටෙන්ඩරයට අදාළ කාර්යයන් විෂය පථයට අනුකූලව අවසන් කර 2019 අගෝස්තු 09 දින සංස්ථාව වෙත භාරදීමට අදාළ ඉදිකිරීම් සමාගම කටයුතු කර ඇතත් ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතියට අනුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අමතර ඉදිකිරීම් කාර්යයන් සහ වෙනස්කම් (Extra works & variations) කිරීමට සිදුවූ බව හා කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා සිදුකර ඇති මිල ගණන් සඳහන් | කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා ඉටුකර ඇති වැඩ සඳහා විධිමත් අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අවසන් බිල්පත සංස්ථාව වෙත ඉදිරිපත් කර ඇතත් කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා සිදුකර ඇති ඉදිකිරීම් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට දෙපාර්තමේන්තු තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව. | |
| (ඇ) | ගොඩනැගිලි දෙකක් යා කෙරෙන යෝජිත ගුවන් පාලම ඉදිකිරීම සඳහා 2021 පෙබරවාරි 18 දින වන විට රු. 6,016,902 ක් වැය කර තිබුණු නමුත් මෙහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට පාලන අධිකාරිය තීරණය කර තිබුණු බැවින් වැයකර තිබුණු මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාම ආර්ථිකමය නොවන බැවින් ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීමට තීරණය කළ බව හා ව්‍යාපෘතිය සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහ අනුමැතිය සඳහා යොමු කර ඇති බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට දායක වූ වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා වැයවූ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඈ) | සිව් මහල් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.28,952,527 ක් වැයකර 2018 මාර්තු 07 දින වන විට භූගත Piling වැඩ අවසන් කර තිබුණු නමුත් 2021 ජූලි 31 දින වන විටත් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | මෙම පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 මාර්තු 07 දින වන විට භූගත Piling වැඩ අවසන් කර තිබුණු නමුත් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ඒ වන විටත් ප්‍රදානය කර නොතිබුණු බව, 2019 වර්ෂයේදී මේ සඳහා ලංසු කැඳවූ බව, ඉදිරිපත් කරන ලද ලංසු තාක්ෂණික ඇගයීම සඳහා අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුවට ඉදිරිපත් කළ බව, පසුගිය කාලසීමාව තුළදී ඉටුකර තිබුණු ඉදිකිරීම් සම්බන්ධ අත්දැකීම් මත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලසුම් නැවත සලකා බලා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයෙන් පයිලින් සඳහා විශ්ලේෂණ තත්ත්ව වාර්තාවක් (piling condition analysis report) ලබාගෙන නැවත ඉදිකිරීම් සැලසුම් කිරීමට අවධානය යොමු කර ඇති බව හා ඉදිරියේදී ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිතව ඇති බව. | කොන්ත්‍රාත් පරිපාලන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විධිමත්ව සිදුකළ යුතු අතර එම කාර්යයන් මනාව කළමණාකරනය කිරීමට මෙන්ම අධීක්ෂණය කිරීමටද කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) දෙමහල් ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 සැප්තැම්බර් 21 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර 2021 පෙබරවාරි 19 දින වන විට මේ සඳහා රු.36,045,249 ක් වැය කර තිබුණි. මූලික ගිවිසුම ප්‍රකාරව 2019 අගෝස්තු 21 දින වන විට ඉදිකිරීම් නිම කළ යුතු වුවද 2021 පෙබරවාරි 19 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත් සැලසුම් කළ ධාරිතාවයට ප්‍රමාණවත් ව්‍යුහයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකර නොතිබීම හේතුකොට ගෙන ගොඩනැගිල්ලේ ව්‍යුහය නැවත සමාලෝචනය කිරීම සඳහා 2020 ඔක්තෝබර් 06 දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) වෙත දැනුම් දී තිබුණි. | සංස්ථාවට රජයෙන් අයවීමට තිබුණු මුදල් ප්‍රමාදවීම හේතුවෙන් ගෙවීම් කිරීම ප්‍රමාදවීම, කොවිඩ් වසංගත තත්ත්වය හා මුල් සැලැස්මේ වෙනස් කිරීම් සිදු කිරීම මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීමට හේතු වූ බව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) විසින් මෙම ගොඩනැගිල්ලේ වානේ ව්‍යුහය විශ්ලේශණය (steel structure design analysis) කළ බව, පාදමේ නැවත සලකා බැලීමක් (verification) සිදු කිරීමට නිර්දේශ කර ඇති බව, ඒ අනුව පාංශු විමර්ශනය (soil investigation) සිදු කළ M/S Soil Matter Pvt Ltd ආයතනයෙන් නැවත වාර්තාවක් ලබාගත් බව, CECB ආයතනයේ අවසාන සැලසුම් සමාලෝචන වාර්තාව 2021 පෙබරවාරි 25 දින ලබාදුන් බව හා ඒ අනුව මේ වන විට සැලසුම් සමාලෝචන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරමින් ඉදිකිරීම් සමාගම විසින් ව්‍යාපෘතිය කරගෙන යන බව. | -එම- |

**3.7 මානව සම්පත්කළමණාකරණය**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 353 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 302 ක් ද පුරප්පාඩු සේවක සංඛ්‍යාව 67 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක්ද විය. පුරප්පාඩු පවතින විධායක තනතුරු 06 ක් ඇතුළුව අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට හා අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමතවී ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව හා නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව පුරප්පාඩු ඇති තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර තනතුරු රැසක් සඳහා බඳවා ගැනීම්ද සිදු කර ඇත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව අවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංස්ථාවේ ඖෂධ නිමාකිරීමේ සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව ප්‍රසිද්ධ දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් මගින් අදාළ තනතුර සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකින් සුදුසුකම් ලත් නිලධාරීන් බඳවාගත යුතු වුවද, යථෝක්ත ක්‍රියාපටිපාටියෙන් බැහැරව සංස්ථාව වෙත සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගේ සම්බන්ධීකරණ ලේකම් වෙතින් ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් අතරින් නිලධාරීන් 17 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | ඖෂධ නිමාකිරීමේ සහායකයින්ගේ අවශ්‍යතාවය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී අනුමැතිය ඉල්ලා ඇති අතර covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඖෂධ ඇසිරීම සඳහා ඇතිවූ සේවක හිඟය නිසා සිදු වූ ගැටළු සහගත තත්වයට පිළියමක් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මෙම සේවකයින් බඳවා ගන්නා ලද බව. | සියළු බඳවා ගැනීම් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සිදු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

------------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------------------- | | --------------------------- | ---------------- |
| 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකරගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | |
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, කාලච්ඡේදයන් තුළ ඉටුකරගත යුතු ක්‍රියාකාරකම් වල කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන නිර්ණායක (Key Performance Indicators) ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකි විය. | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම ආයතනයේ ක්‍රියාපිළිවෙත වූ නමුත් 2020 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද ආකෘතියට අනුව එය පිළියෙල කිරිමට සිදු වූ බව. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 875.8 ක්වූ ක්‍රියාකාරකම් 91 ක් අතරින් රු.මිලියන 735.9 ක් වූ ක්‍රියාකාරකම් 51 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර හෝ නොතිබුණු අතර ක්‍රියාකාරකම් 14 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණද අවසන් කර නොතිබුණි. දෙපාර්තමේන්තු තුනකට අදාළ කිසිදු ක්‍රියාකාරකමක සමාලෝචිත වර්ෂයේදී ලඟා කරගත් භෞතික ප්‍රගතිය හෙළිදරව් කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද ආකෘතියට අනුව ක්‍රියාකාරී සැලස්ම පිළියෙල කිරිමේදී මූල්‍ය ප්‍රගතිය මැනිය හැක්කේ අදාළ ආකෘතියේ දක්වා ඇති භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මකව යනුවෙන් දක්වා ඇති තීරුවට අනුව බව හා ඒ අනුව භෞතික ප්‍රගතියේ ප්‍රතිශතාත්මක අගය මඟින් කොපමණ මූල්‍ය ප්‍රගතියක් ඇතිදැයි මැන බැලිය හැකි බව. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |